# මුල් බුදුසමයේ එන අනුභූතිවාදය ප්‍රවණතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය, ඇපලදෙණියේ වජිරඤාණ හිමි[1]

## හැඳින්වීම

යථාභූතය පිළිබඳ ඥානයේ මිනුම වශයෙන් අනුභූතිය පිළිගන්නා වාදය අනුභූතිවාද යි. මුල් බුදුදහමට අනුව සත්‍ය වූ ඥානය පදනම වශයෙන් ද අනුභූතිවාදය හැඳින්විය හැකි ය. නමුත් අන්ධයන් කිහිපදෙනෙකු හස්තියෙකුගේ එක් එක් අවයව ස්පර්ශ කර විවිධ අදහස් දැක්වූවා මෙන් හුදු අනුභූතිවාදය ඒකදේශමාත්‍ර වූවක් මිස පරිපූර්ණ වූවක් නො වේ. ප්‍රත්‍යක්ෂයෙන් විනිර්මුක්ත ඥානමාර්ග බුදුදහම උපමා කොට ඇත්තේ අන්ධවේණි පරපුරක ගමන් මාවතකට ය. බුදුදහම නිර්දේශ කරනු ලබන ඥානමාර්ගය අනුභූතිවාදයට සමීප වූ ද පැහැදිලි ලෙස ම ප්‍රත්‍යක්ෂය මූලික කරගත් එකකි.

## පර්යේෂණ අරමුණ

උක්ත ගැටලුවට ප්‍රාමාණික පිළිතුරක් සපයා ගැනීම, අධිකාරිය හා ශ්‍රැතිය අන්ත කොට ඇති සියලු ම ආගම්වාද අතරින් අනුභූතිවාදී ප්‍රවණතාව බුදුදහමට අනන්‍ය සාකල්‍යවාදී ලක්ෂණයක් බව සනාථ කිරීම හා බෞද්ධ ඥානමාර්ගයෙහි සුවිශේෂීත්වය හඳුනා ගැනීම මෙහි ලා අපේක්ෂිත අභිමතාර්ථය යි.

## පර්යේෂණ ක්‍රමවේදය

ඥානය පිළිබඳ බෞද්ධ විග්‍රහය විශ්ලේෂණය කරමින් සම්පාදිත අස්මත් අධ්‍යයනයෙහි පර්යේෂණ ග්‍රන්ථ ක්‍රමවේදය භාවිත කොට ඇත. එහි දී දීඝනිකාය ආදී ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ද මුල් බුදුසමයේ ඥානවිභාගය වැනි ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද භාවිත කෙරිණි.

## පර්යේෂණ ගැටලුව

බුදුරජාණන් වහන්සේ තෝරාගත් ඥානමාර්ගය අනෙකුත් අනුභූතිවාදී ඥානමාර්ග අතරින් වෙන්කොට හඳුනා ගත හැක්කේ කෙසේ ද? යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ සාකච්ඡාව

මුල් බුදුදහම යනු පළමු ධර්මසඞ්ගායනාවට පෙර බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයෙහි ම දේශිත ධර්මදේශනාවන්හි අන්තර්ගත ධර්මකරුණු ය. මුල් බුදුසමයේ චින්තනයෙන් ප්‍රකට වන්නේ සංසාරගත විමුක්තිය කේන්ද්‍ර කොටගත් ධර්මයකි. බුදුදහම විමුක්ති සාධනය සඳහා අවශ්‍ය අඞ්ගයක් ලෙස ඥානය අගය කරන අතර, පරම සත්‍යය අවබෝධ කරගැනීමේ එහි උපයෝගීතාව ප්‍රතික්ෂේප කොට නැත. දෘෂ්ටියෙන් වත් ශ්‍රැතියෙන් වත් සීලයෙන් වත් ව්‍රතයෙන් වත් විසුද්ධිය ලැබිය නො හැකිවාක් මෙන් ම දෘෂ්ටිය, ශ්‍රැතිය, ව්‍රතය නොමැතිකමින් ද විමුක්තිය ලැබිය නො හැකි ය.

---

[1]. බෞද්ධ දර්ශනය (විශේෂවේදී - දෙවන වසර), පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය, විශ්වවිද්‍යාලය.
*ewajiragnana@gmail.com*

දර්ශන ක්ෂේත්‍රයෙහි ලා ශබ්දය, දැනීම, හැඳිනීම, අවබෝධය ආදී අර්ථ ප්‍රකාශ කරන ඥානවිභාගය මධ්‍යතන යුගයෙන් පසුව නූතන දර්ශනය ප්‍රධාන චින්තන ධාරා දෙකක් ඔස්සේ විකාශනය විය. එනම්, බුද්ධිවාදය හා අනුභූතිවාදය යි. එහි මූලික සඞ්කල්පය නම් ඥනයේ උල්පත අනුභූතිය බව යි. තවදුරටත් එය පැහැදිලි කළහොත් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මඟින් ලෝකය පිළිබඳ ඥානය ගොඩනගා ගැනීම අනුභූතිවාදය යි. පංචේන්ද්‍රියන් මඟින් බාහිර ලෝකයෙන් ලබන අනුභූතිය ඇසුරෙන් ම ඥානය සඳහා අවශ්‍ය මූලික පදනම ගොඩනැඟෙන බව ඔවුන් පෙන්වා දෙයි. අනුභූතියේ සීමාව ඥානය සීමාව ලෙස පිළිගැනීම මෙහි ප්‍රධාන ලක්‍ෂණය යි.

නමුත් බුදුදහම සත්‍යොක්‍ෂණය සඳහා අනුභූතියෙන් ඔබ්බට ගිය අතීන්ද්‍රිය ඥානය ද සාකච්ඡාවට බඳුන් කරයි. එහි දී අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය  ඉන්ද්‍රියානුභූතිය ඉක්ම වූ බැවින් එය අධිගම කළ යුත්තකි. කෙසේ වෙතදු මුල් බුදුදහමේ අනුභූතිවාදී ප්‍රවණතා අවස්ථා දෙකක දී හඳුනා ගත හැකි ය. එනම්, අනුභූතිවාදී කතිකාවත මත පදනම්ව ධර්මය පැහැදිලි කරන අවස්ථාව හා බුද්ධිවාදී හා ගතානුගතික පිළිගැනීම් සහිත ඥානය දෝෂ දර්ශනයට ලක් කරන අවස්ථාව යනු යි. විෂයවිෂයී සන්නිකර්ෂණයෙන් ලබන ඉන්ද්‍රියානුභූතිය මජ්ඣිමනිකායාගත මධුපිණ්ඩික සූත්‍රය, චූල්ලහත්ථිපදොපම සූත්‍රාදියෙහි සවිස්තර ව දක්වා ඇත. බුදුදහම ලොව ඇති සියල්ල ඉන්ද්‍රිය අනුභූතිය අනුව විග්‍රහ කරයි. ඉන්ද්‍රිය අනුභූතියෙන් වියුක්ත පාරභෞතික සිද්ධාන්තයන් හෝ ප්‍රාගානුභූත ඥාන බුදුදහම අනුමත නො කරන්නේ එබැවිනි. සංයුක්තනිකායාගත සබ්බ සූත්‍රයෙහි ද මෙය විස්තර කොට ඇත. මේ අනුව බුදුදහම නො පෙනෙන නො දකින බලවේගයකට අවකාශ නො දෙයි. නිවන ද  අනිර්වචනීය වූ අනුභූතියකි. භාෂාවේ දුර්වලකම නිසා එය පැහැදිලි කිරීම අපහසු වුවත් **"නිබ්බන්ති ධීරා යථා'යං පදීපො"** යනුවෙන් හෝ ප්‍රකාශයක් කිරීමට නො හැකි බව බුදුදහම සඳහන් කරන්නේ නැත. මෙයින් පැහැදිලි වන්නේ මුල් බුදුදහම ප්‍රකට කරන අනුභූතිවාදී ප්‍රවණතාව නො වේ ද? (එසේ මැයි).

එමෙන් ම, සංශය මාත්‍රයකුදු පහළ කිරීමට ඉඩ නො දෙන අධිකාරිය ගුරු තනතුරෙහි ලා සලකන බුද්ධිවාදී හා ගතානුගතික පිළිගැනීම් සහිත ඥානය දෝෂ දර්ශනයට ලක් කිරීමෙන් ද තහවුරු වන්නේ නැවතත් අනුභූතිවාදී ප්‍රවණතාව යි. මජ්ඣිමනිකායේ සන්දක සූත්‍රයේ දී ශ්‍රැතියේ භව්‍යතාවන් මඟින් පෙන්වා දෙනු ලබන්නේ තර්කය, අනුස්සවය මත පිහිටා ලබන දැනුම සත්‍ය හෝ අසත්‍ය වීමටත් ඉඩකඩ ඇති බව යි. එහෙත් ඒකී තර්කයේ නිගමනය නැවත තර්කයක් වන නිසා ඒ සඳහා අවශ්‍ය වන්නේ තර්කය නො ව ප්‍රත්‍යක්‍ෂය බව සඳහන් කරන්නේ එබැවිනි. පදනම් රහිත, සත්‍යොක්‍ෂණය කළ නො හැකි, අර්ථ රහිත අපරිහාරීය සඞ්ඛ්‍යාත ප්‍රකාශවල තාර්කික දුෂ්කරතාව පෙන්වා දෙන බුදුදහම පදනම් සහිත ප්‍රකාශ පමණක් අනුමත කිරීමෙන් පැහැදිලි වන්නේ බුදුදහමේ අනුභූතිවාදී ප්‍රවණතාව යි. බුදුරජාණන් වහන්සේ අධිකාරය, තර්කය ඥාණමාර්ගයක් වශයෙන් පිළිගැනීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරන ආකාරය කාලාම සූත්‍රයෙන් ද පැහැදිලි වේ. තාර්කිකයන්  වර්ග හතරකි. එනම්,

i. අනුස්සවිකා තක්කිකා - ආගමික සාහිත්‍ය, ශ්‍රැති සම්ප්‍රදාය අනුව තර්ක කරන පිරිස,
ii. ජාතිස්ස තක්කිකා - පෙර ජාති සිහිකරන නුවණ ලැබ තර්ක කරන පිරිස,
iii. ඥායි තක්කිකා - කිසියම් ධ්‍යාන ඵලයක් ලැබ ඒ අනුව තර්ක කරන පිරිස,
iv. සුද්ධ තක්කිකා - තර්කමාත්‍රය ම ගෙන ඒ අනුව තර්ක කරන පිරිස,

යනුවෙනි. බුදුසමය යථෝක්ත තර්කය තුළින් සත්‍ය මතු කරගත නො හැකි බවත් තර්කයේ ඌනතා රැසක් කෙරෙහි අවධානය යොමු කර ඇති බව අවධාරණය වීමෙන් තහවුරු වන්නේ නැවතත් ප්‍රත්‍යක්ෂය සඞ්ඛ්‍යාත අනුභූතිවාදය ප්‍රවණතාව යි. තර්කය මඟින් සත්‍ය බහුත්වයක් නිර්මාණය වේ. තර්කය මාධ්‍ය වූ භාෂාව හුදෙක් චිත්තනිර්මිත අවිද්‍යාව ජනිත සම්මුතියක් වීම, තර්කය අන්තවාදී දෘෂ්ටීන්ට එළඹීමට මග පාදා දෙනු ලැබීම, සත්‍ය මතු කරලීමේ ව්‍යාජ අරමුණින් බැහැර ව හෝ පටු අරමුණු ඇති ව තරග කරන්නන් දක්නට ලැබීම, තර්කය තාර්කිකයාගේ පෞද්ගලික හැකියාව හෝ නො හැකියාව මත රඳා පවතින්නක් වීම යනාදී නයින් බුද්ධිවාදය ඥානාශ්‍රයක් ලෙස ගැනීමේ දුර්වලතා පෙන්වා දීමෙන් තහවුරු වන්නේ අනුභූතිවාදී ප්‍රවණතාව යි.

එමෙන් ම මුල් බුදුදහමේ එන අනුභූතිවාදී ප්‍රවණතාව මඟින් මිනිසාගේ අවධානය දෙවියන් ඇදහීමෙන් ඈත් කොට මිනිස් යුතුකම පිළිබඳ අලුත් දහමක් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇත.

**පර්යේෂණ නිගමනය**

මුල් බුදුදහමේ එන අනුභූතිවාදී ප්‍රවණතාව සෑම අවස්ථාවක දී ම පරීක්ෂණයට හා ප්‍රත්‍යක්ෂයට ඉඩ සලසයි. ආත්ම සඞ්කල්පයේ සාවද්‍යතාවත් සංසාරික හේතු ප්‍රත්‍යය සම්බන්ධතාවත් අවබෝධ කර ගැනුණේ ද අනුභූතිවාදී ඥාන ප්‍රවේශයකින් ය. එසේ ම මුල් බුදුදහමේ ඉගැන්වෙන හේතුඵලවාදය ගොඩනැඟී තිබෙන්නේ ද අනුභූතිවාදය පදනම් කරගෙන ය. ඒ අනුව නුවණැත්තන් විසින් බුදුදහම පිළිගත යුත්තේ ආනුභවික වශයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙනි.

බුදුදහම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පමණක් පිළිගැනීමෙන් අන්තවාදීහු ද නො වෙති. මක්නිසා ද යත් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය අන්තවාදී ව ගැනීමේ දුර්වලතා සලකා බලා ඉන් ඔබ්බට ගිය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වෙත යොමුවන බැවිනි. මෙසේ බුදුදහම යනු ආනුභූතිකව සාක්ෂාත් කළ ඥානය සත්‍යාපනය කළ හැකි උපන්‍යාසයක් වශයෙන් දෙසූ දහමකි. අනභිසම්බුද්ධ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ගිහිගෙයින් නික්ම, මූල සාධක වූ සතර පෙරනිමිති දැකීමේ සිට සඤ්ඤාවෙදයිතනිරෝධසමාපත්තිය අවබෝධ කර ගන්නා තුරු උන්වහන්සේ විසින් ලබන ලද අද්දැකීම් සම්භාරය අනුභූතිය පදනම් කොට ඇති සත්‍යාපනයකි.

**ප්‍රමුඛ පද:** අධිකාරය, අනුභූතිවාදය, ප්‍රත්‍යක්ෂය, ඥාන විභාගය, මුල් බුදුදහම


**මූලාශ්‍රය**

**ප්‍රාථමික මූලාශ්‍රය**

- **අඞ්ගුත්තරනිකාය.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **දීඝනිකාය.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ධම්මපදපාළි.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මජ්ඣිමනිකාය.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සංයුත්තනිකාය.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ද්විතීයික මූලාශ්‍රය**


- අරියවිමල හිමි, කොස්වත්තේ (2010). බුද්ධ ධර්මය. කොළඹ: සමයවර්ධන පොත්හල.
- කලන්සූරිය, ඒ.ඩී.පී. **නූතන බටහිර දර්ශනය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.
- ක්‍රිෂ්ණන්, රාධා ඉන්දීය දර්ශනය. (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ අනුවාදය).
- ජයතිලක, කේ.එන්. (2003). **මුල් බුදුසමයේ ඥානවිභාගය,** (පරි). හේ.මු. තිලකරත්න. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.
- ඥාණසුමන හිමි, දෙල්දූවේ (1980). **ආදි බෞද්ධ දර්ශනයේ මූලධර්ම.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- රාජපක්ෂ, දිල්ෂාන් මනෝජ් (2016). **සංශයවාදය හා ඥානයෙහි සීමා බෞද්ධ දාර්ශනික විග්‍රහයක්.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.
- රාජපක්ෂ, දිල්ෂාන් මනෝජ් (2017). **දෘෂ්ටිවාද විචාරය හා බෞද්ධ දර්ශනය තුලනාත්මක අධ්‍යයනයක්.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.
- විමලඤාණ හිමි, නාඔටුන්නේ (2015). **බුද්ධිවාදී චින්තනය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.
- **ශාස්ත්‍රාලෝචන** (මඬගල කලාපය). ශිෂ්‍ය සුභසාධක සංගමය. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය. අනුරාධපුරය.
- **සම්භාෂා** (11 වන කලාපය). (සංස්.). විජිත වෙලගෙදර සහ ඒ අධිකාරි. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි.
- **සුමඞ්ගලවිලාසිනී දීඝනිකායට්ඨකථා.** (1918). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.
- සොයිසා, ඒ.පි.ද. (1948). ධර්මසමය සිංහල ශබ්ද කෝෂය. කොළඹ.
- හිරියන්න. එම්. **සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය.** (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ අනුවාදය).
- Warder, A.K. Indian buddhism.
- Maurice, Waite (ed.). **Pocket Oxford English Dictionary.** South Asia edition (11th ed.). London: Oxford University press.